# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2025

**9 ශ්‍රේණිය** | **ඉතිහාසය**

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2 යි

**I කොටස**

- I **කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.**
- II **කොටසට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා පළමු කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාරදෙන්න.**

✶ **අංක 01 සිට 20 දක්වා සියලුම ප්‍රශ්නවලට වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01) ලන්දේසීන්ගේ පෙරදිග මූලස්ථානය පිහිටි ස්ථානය වන්නේ
1) පොන්ඩිචේරි 2) බතාවිය 3) කල්කටා 4) මද්‍රාසිය

02) උඩරට රජවරු සහ ලන්දේසීන් අතර සිදුවූ දූත ගමන් වලට අදළ තොරතුරු කිහිපයක් දැක්වේ. ඒවායින් වැරදි ප්‍රකාශය තෝරන්න.
1) දෙපාර්ශවය අතර තෑගි බෝග හුවමාරු කර ගැනීම.
2) සුහදත්වය පළ කිරීම.
3) දෙපාර්ශවය අතර පවතින ගැටලු සාකච්ඡා කිරීම.
4) දෙපාර්ශවය අතර අවි ආයුධ වෙළඳම් කිරීම.

03) සියම් නිකායේ ආරම්භය සිදුවූයේ කිනම් රාජ්‍ය සමයේ පටන් ද?
1) දෙවන විමලධර්මසූරිය රජු සමය 2) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජ සමය
3) කීර්ති ශ්‍රී රාජසිංහ රජ සමය 4) ශ්‍රී විජය රාජසිංහ රජ සමය

04) ලන්දේසි බසින් සිංහල බසට එකතු වූ වචනයක් නොවන්නේ
1) පුස්තකාලය 2) සොල්දර 3) කොකිස් 4) ඉස්තෝප්පුව

05) ලංකාවේ ලන්දේසීන් යටතේ පැවති කොමාන්ඩරියක් වන්නේ මින් කුමක්ද?
1) ගාල්ල 2) ත්‍රිකුණාමලය 3) මීගමුව 4) මන්නාරම

06) තෝමස් මේට්ලන්ඩ් නම් ඉංග්‍රීසි ආණ්ඩුකරුගේ උපායශීලී ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා යෙදවූ ඉංග්‍රීසි නිලධාරියා කවුද?
1) හියුබොයිඩ් 2) ජෝන් ෆයිබස් 3) ජෝන් ඩේවි 4) ජෝන් ඩොයිලි

07) පෙරදිග ඉන්දියා ඉංග්‍රීසි වෙලඳ සමාගම විසින් මුහුදුබඩ ප්‍රදේ පාලනයේ දී පැනවූ බදු වර්ගයක් නොවන්නේ මින් කුමක්ද?
1) පොල් ගස් බද්ද 2) ඇඟ බද්ද
3) ලුණු බද්ද 4) මාළු බද්ද

08) පහත සඳහන් නම් අතරින් 1818 නිදහස් සටනට සම්බන්ධවූවන් දැක්වෙන පිළිතුර තෝරන්න.
A- මඩුගල්ල දිසාව C- පුරන්අප්පු E- බූටැවේ රටේ රාල
B- ඩිංගිරාල D- කැප්පෙටිපොළ නිලමේ
1) A C D 2) A B D 3) B C E 4) A D E

09) 1818 නිදහස් සටන ව්‍යාප්ත වූ ප්‍රදේශයක් නොවන්නේ මින් කුමක්ද?
1) වෙල්ලස්ස 2) මාතලේ 3) හලාවත 4) හේවාහැට

10) පොල් පර්යේෂණාගාර පිහිටියේ
1) තලවකැලේ 2) ලුණුවිල 3) දඹදෙණිය 4) අගලවත්ත

11) ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලය ඉදිකිරීමට පුරෝගාමී වූ මිෂනාරි සමාගම වන්නේ
1) චර්ච මිෂනාරී සමාගම 2) ලන්ඩන් මිෂනාරී සමාගම
3) ඇමරිකන් මිෂනාරී සමාගම 4) වෙස්ලියන් මිෂනාරී සමාගම

12) බෞද්ධයින් උදෙසා මෙරට ප්‍රථමයෙන් ම පිහිටවනු ලැබූ මුද්‍රණාලය වන්නේ
1) කවට කතික මුද්‍රණාලය 2) ලංකෝපකාර මුද්‍රණාලය
3) සරසවි සඳරැස් මුද්‍රණාලය 4) ලංකාභිනව විශ්‍රැත මුද්‍රණාලය

13) පරම විඥාණාර්ථ සමාගම පිහිටුවීමට පුරෝගාමී වූයේ කවුරුන්ද?
1) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි 2) මාරි මියුසියස් මැතිණිය
3) පියදස සිරිසේන මහතා 4) හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා

14) බෞද්ධ පූජනීය ස්ථාන රැකගැනීමේ ව්‍යාපාරයක් ආරම්භ කරනු ලැබුවේ
1) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි 2) වලිසිංහ හරිශ්චන්ද්‍ර තුමා
3) අනගාරික ධර්මපාල තුමා 4) ඩී. බී. ජයතිලක මහතා

15) ✶ ශිවංගල විද්‍යාලය ආරම්භ කිරීමග
✶ ශෛව පරිපාලන සභාව පිහිටුවීමග
ඉහත කරුණු හා සම්බන්ධ හින්දු පුනර්ජීවන ව්‍යාපාරයේ කැපී පෙනෙන නායකයකු වන්නේ කවුද?
1) පොන්නම්බලම් අරුණාචලම් 2) නඩේසන් අයියර්
3) ආරුමුග නාවලර් තුමා 4) පොන්නම්බලම් රාමනාදන්

16) ඉන්දියාවට මුලින්ම පැමිණි පෘතුගීසි කණ්ඩායමේ නායකයා වන්නේ
1) ෆැන්සිස්කෝ ද අල්මේද 2) ලොරෙන්සෝ ද අල්මේද
3) කලන් අලබස් 4) වස්කෝද ගාමා

17) ඉංග්‍රීසීන් ඉන්දියාවට පැමිණෙන අවධියේ ඉන්දියාවේ පාලනය ගෙන ගියේ කිනම් ජාතිකයන් විසින් ද?
1) ප්‍රංශ ජාතිකයන් 2) මුස්ලිම් ජාතිකයන්
3) ද්‍රවිඩ ජාතිකයන් 4) ලන්දේසි ජාතිකයන්

18) හින්දු ජනතාව තුළ ආගමික සංස්කෘතික පිබිදීමකට මගපෑදූ සංවිධානය කුමක්ද?
1) හින්දු සංගමය 2) සත්‍යග්‍රහ ව්‍යාපාරය
3) සිපොයි සංවිධානය 4) බ්‍රහ්ම සමාජය

19) පහත ඉන්දීය නිදහස් ව්‍යාපාර නායකයින් අතරින් අන්තවාදී ජාතික සංගමයේ නියෝජිතයින් පමණක් ඇතුළත් පිළිතුර කුමක්ද?
A- ලාල් ලජ්පත්රායි C- රාම් මෝහන් රායි E- මහත්මා ගාන්ධි
B- බාල් ගංගාධාර් D- බිපන් චන්ද්‍රපාල්
1) B D E 2) A B D 3) C A E 4) C B D

20) "ස්වරාජ්‍ය යනු මගේ ජන්ම උරුමයකි. එය මම ලබාගනිමි." යන ප්‍රකාශය සිදුකළේ මින් කවුරුන්ද?
1) E 2) A 3) B 4) D

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- අනිකුත් ප්‍රශ්න අතරින් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

---

01) පහත සඳහන් සියලු ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු ලියන්න.

(අ)



a) මෙම රූපයෙහි සිටින පුද්ගලයා හඳුනාගෙන නම් කරන්න.
b) මෙම පාලකයාගේ රාජධානිය කුමක්ද?
c) මෙම රජු සහ ගිවිසුමක් අත්සන් කළ විදේශීය ජාතිය කුමක්ද?
d) මෙම රජු හමුවීමට පැමිණි විදේශීය රාජ්‍ය දූතයකු නම් කරන්න.

(ලකුණු 2x4=8)

(ආ)



a) මෙම රූපයේ දැක්වෙන පුද්ගලයා නම් කරන්න.
b) මෙතුමා කිනම් ජාතිකයෙක් ද?
c) මෙතුමාගේ මඟපෙන්වීමෙන් පිහිටවූ සමාගම කුමක්ද?
d) බුදු දහම නඟා සිටුවීමට මෙතුමි විසින් සිදුකළ සේවාවක් ලියන්න.

(ලකුණු 2x4=8)

02)

i. ලන්දේසින් සමඟ සබඳතා පැවැත්වූ උඩරට රජවරු දෙදෙනෙක් නම් කරන්න. (ල 2)
ii. ලන්දේසීන් විසින් ලංකාව තුළ අමතර ආදයම් ලබාගැනීමට ගත් ක්‍රියාමාර්ග දෙකක් ලියන්න. (ල 4)
iii. ලන්දේසි පාලනය හේතුවෙන් ලංකාවේ සමාජ හා සංස්කෘතිය තුළ සිදුවූ වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න. (ල 5)

03)

i. 1815 උඩරට ගිවිසුමට අත්සන් තැබූ උඩරට ප්‍රභුවරුන් දෙදෙනෙක් නම් කරන්න. (ල 2)
ii. බ්‍රිතාන්‍යය අවධානය ලංකාවට යොමුවීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ල 4)
iii. 1818 නිදහස් සටනට බලපෑ හේතු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල 5)

04)

i. 1848 නිදහස් සටන මෙහෙය වූ සිංහල නායකයින් දෙදෙනෙක් නම් කරන්න. (ල 2)
ii. 1848 නිදහස් සටන වන අවධියේ ලංකාවේ සිටි බ්‍රිතාන්‍ය ආණ්ඩුකරු සහ ඔහු විසින් පැනවූ නව බදු වර්ග දෙකක් ලියන්න. (ල 4)
iii. බ්‍රිතාන්‍යයන් විසින් දේශීය කෘෂිකර්මාන්තය නඟා සිටුවීමට ගත් ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල 5)

05)

i. ශ්‍රී ලංකාවට පැමිණි මිෂනාරි සංවිධාන දෙකක් නම් කරන්න. (ල 2)
ii. බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයේ කැපී පෙනෙන ලක්ෂණ හතරක් ලියන්න. (ල 4)
iii. දේශීය සංස්කෘතිය හා බුදු දහම රැක ගැනීමට අනගාරික ධර්මපාල තුමන් විසින් සිදුකළ සේවාව පිළිබඳව කෙටි විස්තරයක් ලියන්න. (ල 5)

06)

i. බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ සිටි පැවිදි නායකයින් දෙදෙනෙක් නම් කරන්න. (ල 2)

ii. හින්දු ආගමික පුනරුදය සඳහා කැපවූ නායකයින් තිදෙනෙක් සහ ඉස්ලාමීය පුනර්ජීවන ව්‍යාපාරය මගින් ආරම්භ කළ පාසලක් ලියන්න. (ල 4)

iii. හෙන්රි ස්ටීල් ඕල්කට් තුමන්ගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ මැයෙන් කෙටි රචනයක් ලියන්න. (ල 5)

07)

i. ඉන්දියාව තුළ බලය පිහිටුවාගත් යුරෝපා ජාතීන් දෙවර්ගයක් නම් කරන්න. (ල 2)

ii. සිපොයි කැරැල්ල ඇතිවීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ල 4)

iii. ඉන්දීය නිදහස් සටනේ කැපී පෙනෙන නායකයෙකු වූ මහත්මා ගාන්ධි ගෙනගිය ක්‍රියාපිළිවෙත පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ල 5)